**ශීර්ෂය - 309 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

-----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු

අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

---------------------------

**(අ) ආදායම් නොවන ලැබීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශුද්ධ වත්කම් / ස්කන්ධය යටතේ දේපළ පිරියත හා උපකරණ සංචිත වශයෙන් ඒසීඒ - 6 හි සඳහන් අගය සඳහන් කළ යුතු වුවත් එය රු.810,991,575ක් ලෙස රු.15,792,164ක් අඩුවෙන් සටහන් කර තිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ සඳහන් රු.8,267,837.39 ක මුදල එය නිවැරදි ශුද්ධ වත්කම් අගය වුවද අවසාන භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහනේ (නිලමුද්‍රාව සහිතව) ශුද්ධ වත්කම් අගය රු.810,991,575 ක මුදලක් සටහන් වී තිබුණි. එය පරිගණක වැඩසටහනේ දෝෂයක් මත සිදුවී තිබූ අතර නැවත නිවැරදි කර ගන්නා ලදි. නමුත් ACA-P ආකෘතියේ අතපසුවීමකින් රු.810,991,575 ක් ලෙස සටහන් කර ඇත. එබැවින් රු.15,792,164 ක මුදල අඩුවෙන් පෙන්නුම් කරයි. | 2021/03 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ සංචිත අගයන් ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | ශුද්ධ වත්කම් / ස්කන්ධය යටතේ ශුද්ධ වත්කම් ලෙස තැන්පතු ගිණුම් ශේෂයෙන් (ඒසීඒ - 4) අත්තිකාරම් ගිණුම් ශේෂය (ඒසීඒ 5ඒ) අඩු කර, භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් සඳහන් කළ යුතු අතර එම අගය (1,273,419,810) වුවත් (1,257,627,647)ක් ලෙස දක්වා තිබීම නිසා 15,792,163ක වෙනසක් නිරූපනය වී තිබුණි. | ඉහත **(i)** පරිදි වෙනස්කම් වූ බැවින් භාණ්ඩාගාර ශුද්ධ වත්කම් රු.15,792,163 ක වෙනසක් වී ඇති බව දන්වමි. | 2021/03 රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව ශුද්ධ වත්කම්හි අගයන් ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැති නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 576,795,555 | චක්‍රලේඛයට අනුව වත්කම් ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රොලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු අතුරින් වාහන හා ගොඩනැගිලි හැර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | 01/2017 චක්‍රලේඛයට අනුව (111) පිරියත හා යන්ත්‍රෝපකරණ (VII) කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු පිළියෙල කරමින් පවතී.(IV) ඉදිකිරීම් පිළිබඳ තොරතුරු ඉදිරියේදි ලබාදීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදෙන ලදී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 4ක කාලසීමාවක් තුල පිරිනමන ලද රුපියල් මිලියන 846ක් ඉක්මවූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 37ක් නිමකිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි.<br><br>කෙසේ වුවද මේ ආකාරයට ඉදිකිරීම් කොන්ත්‍රාත් අතරමග නවතා දැමීම මගින් රාජ්‍ය ආයතනයක් ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීමෙන් නිදහස් විය නොහැකි බවත් මෙම කාර්යයන් නිසිපරිදි ඉටුනොවීම මගින් රාජ්‍ය අංශය පසුබෑමකට ලක්වන | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය සතුටුදායක නොවන අවස්ථා වලදී ගතයුතු පියවර අදාළ ගිවිසුම් ප්‍රකාරව ඉටුකර ඇත. පිරිනමන ලද සඳහන් කර ඇති කොන්ත්‍රාත් 45න් 09 ක් රු.මි.750ක් පමණ වේ. එනම් මුදලින් සියයට 77ක් පමණ කොන්ත්‍රාත් 09ක් තුල ඇතුළත්ව ඇත. කොන්ත්‍රාත් 45න් 10ක් පමණ දැනට සම්පූර්ණ කර භාර දී ඇත. කොන්ත්‍රාත් 14ක් කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වලතා මත සේවාදායක ආයතනය මඟින් අවලංගු කර ඇත. කොන්ත්‍රාත් කිහිපයක් වෙනත් කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටුකරවා ගැනීමට පියවර ගෙන ඇත. තවද මෙම කාලය තුල රටේ පැවැති වසංගත තත්වය හා මිල උච්ඡාවචනයන් නිසා ද ව්‍යාපෘති ප්‍රමාද වීමට හේතු වී ඇත. | දෙපාර්තමේන්තුව විසින් ඉටු කිරීමට භාර ගන්නා ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොවුනහොත් අනෙකුත් රාජ්‍ය ආයතනයන්හි කටයුතු සැලසුම් කළ පරිදි කරගෙන යා නොහැකි වේ. |

බවත්, එම කොන්ත්‍රාත් සඳහා යොදවා ඇති මුදලින් නිසි ඵලයක් ලැබී නොමැති බවත් නිරීක්ෂණය විය.

## 3.2 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 789 ප්‍රකාරව සාමාන්‍ය නියමය වනුයේ රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ වැඩ දෙපාර්තමේන්තුව (ගොඩනැගිලි දෙපාර්තමේන්තුව) වගකිව යුතු බවයි. ඉහත සඳහන් කාර්යයන් හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව 2021 දෙසැම්බර් 31 දිනට ඉංජිනේරුවන් 79ක්, ගෘහ නිර්මාණ ශිල්පීන් 12ක්, සැලසුම් ශිල්පීන් 34ක්, සහකාර ප්‍රමාණ සමීක්ෂකයින් 13ක් සහ තාක්ෂණික නිලධාරීන් 75 ගෙන් යුතු ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාල කාර්ය මණ්ඩලයක් වුවද රුපියල් මිලියන 1,012ක් වටිනාකම වූ ව්‍යාපෘති ලබාකරගෙන තිබුණේ සියයට 50කට අඩු කාර්යසාධනයක් පමණි. | පිළිතුර ලබා දී නොමැත. | මුදල් රෙගුලාසි 789 පරිදි හා ආයතනයේ අරමුණු අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට පවතින ශේෂය වශයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත යවා තිබූ ගොඩනැගිලි පිළිබඳ වාර්තාවේ ඇතුළත් වර්ග මීටර් 6262.84ක බිම් ප්‍රමාණය සහිත ගොඩනැගිලි 37ක තක්සේරු වටිනාකම සඳහන් කර නොතිබූ අතර එම වාර්තාවේ සඳහන් මහනුවර පිහිටි හන්තානේ නිල නිවාස 02ක හා කටුකැලේ වත්ත කාර්යාල ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය පිළිබඳව සඳහන් කර නොතිබුණි. එබැවින් ආයතනය සතු ගොඩනැගිලි වටිනාකමෙහි නිවැරදිතාවය තහවුරු නොවීය. | ප්‍රධාන තක්සේරු නිලධාරි ඇමතු ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්ගේ 05-13-04-01 හා 2021.10.26 දිනැති ලිපිය මඟින් මේ වන විට තක්සේරු කර නොමැති ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර දෙන ලෙසට ඉල්ලා ඇත. එසේම මහනුවර පිහිටි හන්තාන නිල නිවාස දෙකෙහි හා කටුකැලේ වත්ත කාර්යාල ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය ඉදිරියේදී මැනුම් කර එම තොරතුරු ලේඛණ ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාල ගොඩනැගිලි තක්සේරු කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් පිළිබඳව යාවත්කාලීන වූ වාර්තාවේ ඉඩම් 45කින් ඉඩම් 12කට පමණක් ඔප්පු පවතින අතර ඉතිරි ඉඩම් 33 සඳහා හිමිකම් ඔප්පු නොමැත. මෙහි සඳහන් ඉඩම් 45 අතුරින් ඉඩම් 19ක (අක්කර 08 රූඩ් 02 පර්චස් 37.82) තක්සේරු වටිනාකම සඳහන් නොවන අතර ආරුගම්බේ පිහිටි ඉඩමෙහි බිම් ප්‍රමාණය පවා සඳහන් නොවීය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ ස්ථාවර වත්කම්වල සඳහන් ඉඩම් වටිනාකම්හි නිරවද්‍යතාවය තහවුරු නොවීය. | මෙම දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම් 45ක් අතුරින් ඉඩම් 12ක් වෙනුවෙන් ඔප්පු ලබාගෙන ඇති අතර ඉතිරි ඉඩම්වලට අදාල ඔප්පු ලබා ගැනීම සඳහා අදාල ප්‍රාදේශිය ලේකම්වරුන් හා ඉඩම් කොමසාරිස් ජනරාල් සමඟ සම්බන්ධවෙමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.<br>මෙම දෙපාර්තමේන්තුවට අයත් ආරුගම්බේ පිහිටි ඉඩමෙහි හිමිකම් ඔප්පුව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ලබාදීම සඳහා අදාල මැනුම් කටයුතු සිදු කිරීම සඳහා එම ඉඩම් කොටස පරීක්ෂා කිරීමේදී එය කළපු සහ මඩ ගොහොරු තත්වයක පවතින බැවින් නිසියාකාරව මැනුම් කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවට ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තු අම්පාර දිස්ත්‍රික් කාර්යාල විසින් දන්වා ඇත. ඒ අනුව එම ඉඩම් කොටස ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයක පවතින බැවින් ඒ සඳහා විකල්ප ඉඩමක් ලබා දෙන ලෙස පොතුවිල් ප්‍රාදේශිය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. | අදාල ඔප්පු ලබා ගැනීමට හා තක්සේරු කිරීම් ලබා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඈ) | දියතලාව පොලිසිය අසල පිහිටි රූඩ් 01ක තක්සේරු වටිනාකම රු.10,550,000 සහිත නිල නිවාසය අයත් ඉඩම ප්‍රධාන ඉංජිනේරු (Kandy II) මගින් බදුල්ල ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දී ඇති නමුත් එය බදුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් භාවිතයට නොගන්නා බැවින් නැවත එම දේපළ දිස්ත්‍රික් කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා නැවත දෙපාර්තමේන්තුවට පවරා දෙන ලෙස 2017.04.11 දින අංක 12-06-64 ලිපිය මගින් මහනුවර ප්‍රධාන ඉංජිනේරු විසින් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත. නමුත් මේ සම්බන්ධ ලිපි ගොනු පරීක්ෂා කිරීමේ දී මෙම පවරා දීම සම්බන්ධව තොරතුරු සොයා ගත නොහැකි විය. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අයත් දියතලාව පොලිසිය අසල පිහිටි ඉඩම බදුල්ල ප්‍රාදේශිය ලේකම් වෙත පවරා දී ඇත්තේ 2014 වර්ෂයේදීය. මෙම පවරා දීමට කටයුතු කරන අවස්ථාවේදීම අප වෙත විකල්ප ඉඩමක් ලබා දෙන බවට දන්වා ඇත. අදාල විකල්ප ඉඩම පවරාගැනිමට අවශ්‍ය කටයුතු සිදුකරමින් තිබුණි. | අදාල ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට හා අදාල නිරවුල් කිරීම් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සංචාරක බංගලා නඩත්තුව<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් ලෙස "රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම" ලෙස සඳහන් කර තිබුණි. එසේ උවද දෙපාර්තමේන්තුවට ආදායම් උත්පාදනය කරනු ලබන සංචාරක බංගලා සම්බන්ධයෙන් පහත | | |

සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (i) කතරගම සංචාරක බංගලාව<br>- නාන කාමර දොරවල් තෙමී දිරාපත් වී ඉන් නානකාමර ඇතුලත අපිරිසිදු තත්ත්වයකට පත්වී පවතී.<br>- බිත්ති පුපුරා ඇති ස්ථාන පවතින අතර නාන කාමර බිත්ති අතුරා ඇති ටයිල් සමගින්ම පුපුරා ගොස් ඇත. | අදාළ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී. | සංචාරක බංගලා නිසි පරිදි නඩත්තු කරමින් නවාතැන් කරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |
| (ii) නුවර එළිය සංචාරක බංගලාව<br>- සංචාරක බංගලාවේ නාන කාමර තුල ජල කරාම කැඩී තිබූ අවස්ථා සහ නානකාමර තුල පවතින උණු වතුර තාපක නිසි පරදි ක්‍රියා නොකරන අවස්ථා පැවති අතර ගොඩනැගිල්ල තුලද නවීකරණය විය යුතු ස්ථාන ඇති බව නිරීක්ෂණය විය.<br>- අවට පරිසරය ප්‍රියමනාප ලෙස සංවිධානය කර නොතිබූ අතර නවාතැන්කරුවන්ට අවශ්‍ය පහසුකම් සැපයීම දුර්වල මට්ටමක පැවතුනි. | සමහර කොටස් අවපැහැගැන් වී ඇති අතර තීන්ත ආලේප කරන තෙක් පිරිසිදු කරන මෙන් සංචාරක බංගලා භාරකරු වෙත උපදෙස් දී ඇත.<br>සියළු අලුත්වැඩියා කටයුතු සඳහා වර්ෂ වල ඇස්තමේන්තු ඉදිරිපත් කලද ප්‍රතිපාදන නොලැබුනු අතර මේ වර්ෂය සඳහා මේ වන විටත් ඇස්තමේන්තු සකස් කරමින් පවතින අතර ප්‍රතිපාදන ලද වහාම අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමි.<br>අවට පරිසරය හා අන්දර වැට කැපීම සඳහා සංචාරක බංගලා භාරකරු වෙත උපදෙස් ලබා දී ඇත. සංචාරක බංගලාව මනා ලෙස පවත්වාගෙන යාම සඳහා සංචාරක බංගලා භාරකරු වෙත සහාය ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි. | සංචාරක බංගලා නිසි පරිදි නඩත්තු කරමින් නවාතැන් කරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |
| (iii) නමුණුකුල සංචාරක බංගලා 1 හා 2<br>- අංක 1 සංචාරක බංගලාවේ එක් කාමරයක ජල කරාම නිසිපරිදි ක්‍රියාත්මක නොවන අතර නාන කාමර තුල රැස්වන ජලය නිසි පරිදි බැස නොයන තත්ත්වයක පැවතුනි.<br>- ඉදිරිපස වහලයේ සිවිලිම විනාශ වී දිරාපත් වෙමින් පැවතුනි.<br>- සංචාරක බංගලාව පිටුපස ඇති ගොඩනැගිල්ල ගරා වැටෙමින් පැවතුනි.<br>- සංචාරක බංගලාව සඳහා නිත්‍ය බංගලා භාරකරුවකු එක්කර නොතිබුණි. | 01. අංක 02 දරන කොටස පිරිසිදුව තබා ගැනීම සම්බන්ධව සංචාරක බංගලා භාරකරුට 2022.04.21 වන දින ලිපියක් මගින් දන්වා ඇත.<br><br>02. මෙම වසර තුල අළුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු පිළියෙල කරමින් පවතී. අවට පිරිසිදු කිරීම පිළිබඳව සංචාරක බංගලා භාරකරු දැනුවත් කර ඇත.<br><br>03. මෙම වසර තුල අළුත්වැඩියා කිරීමට ඇස්තමේන්තු පිළියෙල කරමින් පවතී. | සංචාරක බංගලා නිසි පරිදි නඩත්තු කරමින් නවාතැන් කරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | හන්තාන සංචාරක බංගලාවේ මුළුතැන්ගෙයහි ටයිල් ගැලවී ඇති අතර, කාමර අංක 02 හි ජනේලය දිරාපත් වී ගැලවී අනාරක්ෂිතව පවතින අතර කාමරය තුලට ස්ලැබ් එක තුලින් ජලය කාන්දු වේ. | 01. පසුගිය වර්ෂවල ප්‍රතිපාදන නොලැබුණු බැවින් අළුත්වැඩියා කටයුතු කල නොහැකි විය. මෙම වර්ෂය සඳහා ද මේ වන විට ඇස්තමේන්තු ඉදිරිපත් කර ඇති අතර ප්‍රතිපාදන ලද වහාම අළුත්වැඩියා කටයුතු ඉටුකල හැකි බව කාරුණිකව දන්වමි.<br><br>02. බැල්කනියේ කොන්ක්‍රීට් තට්ටුව තුලින් ජල කාන්දුව සිදුවන අතර එම තත්වය මගහරවා ගැනීම සඳහා බැල්කනියට වහලයක් ගැසීමට තීරණය කරන ලදී. ඒ සඳහා වැය වන මුදල ඉහත සඳහන් ඇස්තමේන්තුවෙහි ඇතුලත් කර ඇති අතර, ප්‍රතිපාදන ලද වහාම කාර්යය ඉටුකල හැකි බව කාරුණිකව දන්වමි. | සංචාරක බංගලා නිසි පරිදි නඩත්තු කරමින් නවාතැන් කරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |
| (v) | යාපනය සංචාරක බංගලාව<br>- කොමඩ් සිස්ටන් නිසි පරිදි ක්‍රියා නොකරන අතර කොමඩ් පියන් කැඩී පැවතුනි. කාමරවල ටයිල් අතුරා ඇති අතර එහි නිමාව ඉතා පහල මට්ටමක පවතී.<br>- නාන කාමරයන්හි රෙදි දැමීම සඳහා සවිකර ඇති උපකරණ විනාශ වෙමින් පවතින අතර නාන කාමරවල වතුර බැස්සවීම සඳහා නිසි ක්‍රමවේදයක් යොදා නොතිබීම හේතුවෙන් නාන කාමර ජලයෙන් පිරී පවතී.<br>- ජල ටැංකියෙහි ජල කාන්දුවක් දිගු කාලයක් තිස්සේ පවතින අතර ඒ හේතුවෙන් විශාල ජලය අපතේ යැමක් සිදුවේ. | අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කර ඇත. | සංචාරක බංගලා නිසි පරිදි නඩත්තු කරමින් නවාතැන් කරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |
| (vi) | තංගල්ල සංචාරක බංගලාව<br>- මෙම සංචාරක බංගලාව දිගු කාලයක සිට සංචාරකයින්ට ලබා නොදෙන නමුත් සංචාරක භාරකරුවන් දෙදෙනෙකු පත්කර ඇත. පසුගිය වසර 02ක කාලය තුළ මෙම සංචාරක බංගලාව අමුත්තන් සඳහා වෙන් කිරීම සිදු නොවූ ලෙස පිළිතුරු ලබා දී ඇතත් 2019 වර්ෂයේ ජල ගාස්තුව රු.29,000ක් හා විදුලි ගාස්තුව රු.40,815ක් වූ අතර 2020 වර්ෂයේ ජල ගාස්තුව රු.107,375 හා විදුලි ගාස්තුව රු.155,489 ද 2021 වර්ෂයේ ජල | ඉන්වෙන්ට්‍රි ලේඛණ යාවත් කාලීන කර ඇත.<br>"දැනට හම්බන්තොට ප්‍රාදේශීය කාර්යාලය මෙම ගොඩනැගිල්ල තුල පවත්වාගෙන යනු ලබන අතර මාතර ප්‍රාදේශීය කාර්යාලයට අයත් බඩුබාහිරාදිය ද මෙම ගොඩනැගිල්ල තුල පවතී. එබැවින් අදාල බඩුබාහිරාදියෙ හි ආරක්ෂව වෙනුවෙන් හා එම ගොඩනැගිල්ල | ජල විදුලි වියදම් විශාල වශයෙන් ඉහල යැම පිළිබඳව දෙපාර්තමේන්තුව සොයා බලා කටයුතු කල යුතුය. |

ගාස්තුව රු.97,088 හා විදුලි ගාස්තුව රු.144,956ක් විය. ඒ අනුව 2019 වර්ෂයට සාපේක්ෂව ජල ගාස්තුව 2020 වර්ෂයේ සියයට 270 හා 2021 වර්ෂයේ සියයට 234 කින් සහ විදුලි ගාස්තුව 2020 වර්ෂයේ සියයට 280 කින් හා 2021 වර්ෂයේ සියයට 255 කින් අසාමාන්‍ය ලෙස වැඩිවී තිබුණි.

නිසි පරිදි පවත්වා ගෙන යාම හා මුර රාජකාරී වෙනුවෙන් මේ වන විටත් තංගල්ල සංචාරක බංගලාවට අනුයුක්තව සේවය කරනු ලබන සංචාරක බංගලා භාරකරුවන් දෙදෙනාගේ සේවය ඒ සඳහා ලබා ගැනීමට කටයුතු කර ඇත.
තවද පසු ගිය වසර දෙකෙහි පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් සංචාරක බංගලාව අමුත්තන් සඳහා වෙන් කිරීමේ කටයුතු සිදු නොකළ අතර , ඉදිරියේදී අමුත්තන් වෙනුවෙන් සංචාරක බංගලාව වෙන් කිරීම සඳහා කටයුතු කරමින් පවතින බව වැඩිදුරටත් දන්වමි."

(ඊ) සංචාරක බංගලා තුල නවාතැන් ගන්නා සංචාරකයින් නවාතැන් ගන්නා කාලය තුල කිසියම් අලාභ හානියක් සිදු වුවහොත් ඒ සඳහා අදාල ගාස්තුව සහ භාවිතා කරනු ලබන කොට්ට උර හා ඇද ඇතිරිලි සෝදා පවිත්‍ර කිරීම සඳහා ගාස්තුවක් බංගලා භාරකරුට ගෙවා රිසිට් පතක් ලබා ගත යුතු බව නේවාසිකයන්ට උපදෙස් ඇතුළත් අත් පත්‍රිකාවේ සඳහන් වුවද බංගලා භාරකරුවන් විසින් එසේ රිසිට් පත්‍රයක් නිකුත් කර නොතිබුණි. ඒ වෙනුවට කඩදාසියක සටහන් කර බිල් පතක් ලබාදෙන බව නවාතැන්කරුවන් සඳහන් කර සිටි. තවද රාජ්‍ය නිලධාරින්ට මෙම සංචාරක බංගලා ලබාදීමේ දී දිනකට කාමරයකට රු.1,500ත් 2,000ත් අතර ගාස්තුවක් අයකරනු ලබන බැවින් මූලික පහසුකම් හෝ ලබා දීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතුය.

මේ සම්බන්ධව කළමණාකරන කමිටු රැස්වීමේදී සාකච්ඡාකර තීරණයක් ගැනීමට කටයුතු කරන බව දන්වමි. තිබෙන ප්‍රතිපාදන මත මූලික පහසුකම් හැකි උපරිමයෙන් ලබා දී ඇත.

සංචාරක බංගලා නිසි පරිදි නඩත්තු කරමින් නවාතැන් කරුවන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය.

## 3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

**විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

2021 වර්ෂයේ ආරම්භ කළ ව්‍යාපෘතිවල ප්‍රගතිය

| ව්‍යාපෘති වර්ගය | ආරම්භ කළ ව්‍යාපෘති ගණන | කිසිදු කාර්යයක් ඉටු නොකළ ව්‍යාපෘති ගණන | සියයට 50ට අඩු ප්‍රගතියක් ඇති ව්‍යාපෘති ප්‍රතිපාදන රු.මි | ව්‍යාපෘති ගණන | ප්‍රගතිය (සියයට) |
|---|---|---|---|---|---|
| පිරිවැටුම් ව්‍යාපෘති | 119 | 14 | 302.1 | 24 | 5-50 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (Turnkey) | | | | | | 2021 වසරේ පැවැති උග්‍ර වසංගත තත්වය, රටේ ආර්ථික අවපාතය මත සිදු වූ කොන්ත්‍රාත්කරුවන් ගේ ගෙවීම් ප්‍රමාදය, ඉදිකිරීම් ද්‍රව්‍ය ඌනතාවය ආදිය සෘජුව බලපාන ලදී.ඉහත තත්වය යටතේ වුවද ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ධාරිතාවය අනුව ව්‍යාපෘති වල කාර්යසාධනය අත්පත් කරගැනීමට කටයුතු කර ඇත. | නිසි කාර්යසාධනය ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| උපදේශාත්මක ව්‍යාපෘති (Consultancy) | 68 | 07 | 528.1 | 09 | 5-47 | | |
| ව්‍යාපෘති කළමනාකරණ ව්‍යාපෘති (Project Management) | 28 | 01 | 171.89 | 06 | 10-50 | | |
| නඩත්තු කිරීමේ ව්‍යාපෘති (Maintenance) | 40 | 06 | 10.56 | 03 | 1-50 | | |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 341 ක් වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.687,441 ක් වී තිබුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටම ඉංජිනේරු සේවය - පුරප්පාඩු 11 සම්පූර්ණකර ගැනීමට කටයුතු කරන ලද අතර අනෙක් තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටි අනුමැතියට යවා, ලිඛිත විභාග පවත්වා ඉදිරි වැඩ කටයුතු කරමින් පවතී. | ආයතනයේ අරමුණු නිසි පරිදි ලඟා කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | ස්ථිර | කොන්ත්‍රාත් | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 126 | 99 | - | 27 |
| තෘතියික මට්ටම | 24 | 07 | 01 | 17 |
| ද්විතියික මට්ටම | 285 | 250 | - | 35 |
| ප්‍රාථමික මට්ටම | 178 | 136 | 03 | 42 |
| **එකතුව** | **613** | **492** | **04** | **121** |

පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව මේ දක්වාම අපොහොසත් වී තිබුණි.